කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2019

2023 - අප්‍රේල්

**BCOM E1025 - සූක්ෂම ආර්ථික විද්‍යාව**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්ණ අංක 01**

"ආර්ථික විද්‍යාව යනු නිෂ්පාදනය බෙදාහැරීම සහ පරිභෝජනය සඳහා මිනිසුන් තනිතනිව සහ සාමුහිකව හිඟ සම්පත් වෙන්කරන ආකාරයයි."

අ. හිඟකම සහ ආවස්ථිත පිරිවැය, යන සංකල්ප දෙක ව්‍යාපාරික තීරණ ගැනීමේදී ඉටු කරන කාර්යභාරය කුමක්ද ?

(ලකුණු 07)

ආ. "ආර්ථික විද්‍යාවේ මූලාරම්භය වන්නේ අසීමිත මිනිස් අවශ්‍යතා සහ සීමිත සම්පත් වේ." මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

ඇ. පහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න.

i. වෙළඳපොළ යාන්ත්‍රණයට සමාජයේ ඇති සියලුම ආර්ථික ගැටලු විසඳිය හැකියි.

ii. ආවස්ථිත පිරිවැය නිෂ්පාදන පිරිවැයට සමාන වේ.

iii. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය සම්පත් වැඩි නොකර ඉහළට ගමන් කළ හැකිය.

iv. රජය නූතන ආර්ථිකයේ කේන්ද්‍රිය අංගයයි. (central element)

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 02**

" ඉල්ලුම් වක්‍රයක් මගින් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුල භාණ්ඩයක හෝ සේවාවක මිල හා ප්‍රමාණය අතර සම්බන්ධය පෙන්වයි."

අ. ඉල්ලුම වක්‍රය දිගේ ගමන් කිරීම සහ ඉල්ලුම් වක්‍රය විතැන්වීම අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. පාරිභෝගිකයාගේ ආදායම් වෙනස්වීම සහ ආදේශක භාණ්ඩවල මිල වෙනස්වීම, භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුමට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. ඉල්ලුම සහ සැපයුම් වක්‍රවල ඡේදනයෙන් වෙළඳපල සමතුලිතතාවය තීරණය වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඊ. i. පහත සඳහන් ඉල්ලුම සහ සැපයුම් ශ්‍රිතයන්ගෙන් සමතුලිත ප්‍රමාණය සහ මිල ගණනය කරන්න.

Q d = 100-15p

Qs = 100p

(ලකුණු 03)

ii. සැපයුම් ශ්‍රිතය එසේම පවතින විට, ඉල්ලුම් ශ්‍රිතය Qd= 100-15p සිට Qd = 150-15p ලෙස වෙනස් වන්නේ නම් සමතුලිත මිල කෙසේ වෙනස් වේද ?

(ලකුණු 02)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 03**

අ. ඉල්ලුමේ මිල නම්‍යතාවය තීරණය කරන සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. i. ශ්‍රී ලංකාවේ වත්මන් අර්බුදකාරී ආර්ථික කාල පරිච්ඡේදය තුළ අවන්හල් ආහාර සඳහා වියදම් කෙසේ වෙනස් වේදැයි ඔබ අපේක්ෂා කරනවාද ?

ii. ආදායම් නම්‍යතාව මෙම වෙනස්කම් පැහැදිලි කිරීමට උපකාරී වන්නේ කෙසේද ?

(ලකුණු 07)

ඇ. i. භාණ්ඩයක ඉල්ලුමේ චාප නම්‍යතාවය සහ ලක්ෂ්‍ය ප්‍රත්‍යාස්ථතාව පිළිබඳ සංකල්පය විස්තර කරන්න.

(ලකුණු 04)

ii. පහත පරිදි උපකල්පිත මිල හා ඉල්ලුම් ප්‍රමාණ වගුවක් ලබා දී ඇතැයි සිතමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| මිල (රු.) | 300 | 280 | 260 | 240 | 220 |
| ප්‍රමාණය | 100 | 200 | 300 | 400 | 500 |

- රු. 260 සිට රු.240 දක්වා මිල පහත වැටීම සඳහා නම්‍යතාවය සොයන්න.
- රු. 280 සිට 300 දක්වා මිල වැඩිවීම සඳහා නම්‍යතාවය ගණනය කරන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 04**

අ. i. සංඛ්‍යා සූචක උපයෝගිතා (cardinal utility) සහ ක්‍රම සූචක උපයෝගිතාව (ordinal utility) අතර වෙනස පැහැදිලි කරන්න.

ii. සංඛ්‍යා සූචක උපයෝගිතාවය (cardinal utility) මැනීමේ ගැටළු මොනවාද ?

(ලකුණු 06)

ආ. “පාරිභෝගිකයාගේ ආදායම වැඩි වන විට, පාරිභෝජනය අඩු වන භාණ්ඩය බාල භාණ්ඩයකි.” ඔබ මෙම ප්‍රකාශයට එකඟ ද ? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. i. iso-cost සහ iso-quant වක්‍ර අතර වෙනස කුමක්ද ?

(ලකුණු 04)

ii. නිෂ්පාදන විශ්ලේෂණයේ දී, නිෂ්පාදන ශ්‍රිතය ප්‍රයෝජනවත් වන්නේ කෙසේද ?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 05**

අ. පහත සඳහන් පිරිවැය සංකල්ප අතර වෙනස හඳුනා ගන්න.

i. සාමාන්‍ය මුළු පිරිවැය සහ ආන්තික පිරිවැය

ii. සාමාන්‍ය ස්ථාවර පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය

iii. පුද්ගලික පිරිවැය සහ සමාජ පිරිවැය

(ලකුණු 06)

ආ. සම් නිෂ්පාදන සමාගමක ( leather producing company) පහත විචල්‍ය පිරිවැය ශ්‍රිතය දී ඇත.

$TVC=500Q-10Q^3 + 0.35Q^4$

සමාගමේ ස්ථාවර පිරිවැය රුපියල් 550,000 ට සමාන නම්, සොයාගන්න.

i. මුළු පිරිවැය ශ්‍රිතය

ii. ආන්තික පිරිවැය ශ්‍රිතය

iii. සාමාන්‍ය විචල්‍ය පිරිවැය ශ්‍රිතය

(ලකුණු 06)

ඇ. i. පරිපූර්ණ තරඟකාරී වෙළඳපල යටතේ කෙටි කාලීන සමතුලිතතාවය සහ දිගු කාලීන සමතුලිතතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii. සමාගමක් මිල ගන්නෙකු (price taker)වන්නේ කුමන වෙළඳපල තත්වයන් යටතේද ?

(ලකුණු 02)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 06**

අ. i. ඒකාධිකාරය යටතේ මිලකරණය (pricing) පූර්ණ තරඟකාරිත්වය යටතේ මිලකරණයට වඩා වෙනස් වන්නේ කෙසේද ?

ii. "ඒකාධිකාරී සමාගමක මිල සෑම විටම තරඟකාරී මිලට වඩා වැඩි වේ. " සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

ආ. i. ඒකාධිකාරී තරඟයේ ලක්ෂණ මොනවාද ?

ii. "ඒකාධිකාරී තරඟය යනු පරිපූර්ණ තරඟය සහ ඒකාධිකාරය අතර මැදි තත්වයකි."

ඔබ ඒකඟ වෙනවා ද ? පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ. කතිපයාධිකාරී (oligopoly) වෙළඳපොලේ ප්‍රධාන ලක්ෂණ මොනවාද ?

(ලකුණු 04)

(මුළු ලකුණු 20)